# දෙඩවිල්ල

සිනන්දොරේ
අසූතුනේ
අපේ උන් ගහනකොට
මං ඇවිත්
උඹව බේරගත්තා
ඒ කාලෙ
මට තිබුන හයියට

සේසතම
ගෙන්දගම් පොළොවට පස්කර
උඹ උතුරට ගියේ අත් වන වන

සින්නදොරේ
තාමත් අපේ උන්
උඹලට ගහනවා
මට දැං බැහැ
උඹව බේරගන්නට එන්නට
උන් මටත් ගහනවා
දැං තියෙන හයියට

මට දුකයි සින්නදොරේ
අපි සන්තෝසෙන් උන්නෙ
ඒ දවස්වල
එහෙම දවස් අයෙ එන්නෙ නැහැ
මේ ගිනි අවුළුවන විදිහට

මහේෂ් මුණසිංහ



## දයාබර මාමේ

මාමේ ඔබ දුටුව කැන්ගරූ පරිසරය
වෙනසක් නොමැත මට නම් එය මනහරය
ඔබ නම් කීවේ මෙය හරියට සුන්දරය
නැතිවද මාමේ ඔබ අත දැන් සැරයටිය

සිතුවේ නැතත් අවුරුදු විස්සකට උඩින්
ගතට වයස යයි සැමගේ සිතට කලින්
මිළ මුදලෙන් කිසි එල නැති වග දැනුනෙන්
පින්කම් කරයි ඉඳහිට සැනසෙන අටියෙන්

දා ගැබ උඩින් පෙණුනත් නෙක නව කොඩිවැල්
දෙවැට දිගේ නැත අද තව වතු සුදු මල්
මහගෙයි වත්ත පිරිලා වට කොට කටුවැල්
නොසිතුණේද මේ ගැන විසි වසරක් කල්

කාටත් හොරෙන් අයියා මීනව බැන්ඳා
ඒ ගැන සිතා අම්මා බොහො දුක් වින්ඳා
සුදු එකියක ආවොත් මල්ලී කැන්ඳා
වෙන්නට එපා ඔබ ඒ අය හට බාදා

පාළුව තනිය දොම්නස මග හැර ගන්න
මාමගෙ දැනුම අන් හට බෙදලා දෙන්න
කවිවැල් ලියා ඔබ සිත සනසා ගන්න
බෑණා ලේලි සුදු හම ගැන නොතකන්න

මාමගෙ සිතට සුව සහනය ගෙන එන්න
අද සිට මමත් යදිනෙමි දෙවියන් ඔන්න
ජාතිය කුල ආගම ගැන නොසිතන්න
පෝයටවත් මාමා පන්සල් යන්න

**ප්‍රියා ප්‍රනාන්දු**

### ඇයි මෙතරම් සුදු කවර

**සුදු කවර සුදු කවර**
**තැපැල් පෙට්ටියේ ඇති**
**බිල්පත්ම රැගෙන එන**
**සුදු කවර සුදු කවර**

**පසුම්බිය හිස් වන**
**බව දැන දැනත්**
**බලන්නට හොර වුණත්**
**බලන්නටම වෙන**
**සුදු කවර සුදු කවර**

ලක්ෂ්මී ගුණරත්න

## එයා වරදේ බැඳෙන්නෙ නෑ

**අඳුන් ඉලූ මායම් ඇස්**
**කවුළු දොරින් එබී බලා**
**නිබ්බුත පද ගයනු රිසිව**
**අලුත් රුවක් සොයන පැයේ**

**අඳුර මැදින් දෙපා ගැටෙන**
**මාවත දුර ඈත කොණේ**
**පුරුදු සුවඳ තුරුළු කරන්**
**මා හිමි නොවැ අර එන්නේ**

**කවුළුවෙ දොර පියන් වැසී**
**මොහොතක දැඩි නිහැඬියාව**
**නිබ්බුත පද ඇය ගැයුවද**
**කෝ මා හිමි මොකද පමා**

මංගලිකා පෙරේරා
**ඩමාම්-සවුදි අරාබිය**



සංස්කරණය
තුෂාරී ප්‍රියංගිකා

## මගේ දියණී

**කිසිම හැඩක් නැති**
**සඳට බැහැ නොවැ**
**සමවෙන්න පුංචි දුවේ**
**නුඹෙ හැඩ රුවට**

**නිශාවට පායන තරු එළිය**
**සම වෙයි ද දියණිය**
**දවස පුරාවට නගනා**
**නුඹෙ සිනාවට**

**විහඟ ගීතයෙ මිහිරක්**
**කොහිද මගේ දියණිය**
**නුඹෙ රස බර රස**
**කතා වල මිස**

**හේමමාලි**



## සංක්‍රමණිකයින් ට ඔවදන්

*මොරගොඩ මලියසේනගේ "තලතුනා සංක්‍රමණිකයාගේ සංතාපය" ට පිළිතුරක්*

රැල හා එක්ව දිව යන කෙට    එළදෙනක
විල සින නොම සිතා දුර දිග    කිසි දෙයක
බල බල සිහින සුළු ධනපති සැප    ලොවක
කල කට ඉහත ආවෙමු අප    දුරු රටක

වැඩු හැදු දෙමව්පිය දෙපලට    දුක දීලා
මව බඳු අපේ සිරිලක අමතක    කරලා
අප හුදු දියුණුවම ගැන පමණක්    සිතලා
ඔහෙ ඉඳු! ආවනම් දුක, සැප සේ    උසුලා

කලක් මෙහි ඇවිත් දැන් ගතවී    යන්නේ
පෙලක් වෙලාවට සිරිලක    සිහිවන්නේ
පරක් කුවක් නැත වැඩ නූලට    වෙන්නේ
අරක් කුව කුමට අද විස්කිය    බොන්නේ

පිරි තිරි නෙක අසිරි බැළු හැම තැන    තිබෙන
සිරි ලංකාව අප ඉපදුණු පින්    දෙරණ
සරි කරනට ඇයව පුද දෙමු අපේ    පණ
නරි වාදම ගසමු ලද ඉඩ සෑම    තැන

දෙන්නට පණ මුසාවාද    දෙඩුවාට
යන්නට නැත සිතක් ආපසු    සිරිලක ට
ඉන්නට හැකි නිසා නොරටට    වී ජයට
යුද්දෙට ආ වඩමු බුදු බණ පසෙක කොට

කොකා අදින විට ගිනි ආයුධ    ගොන්නේ
මොකා වුනත් දරුවොයි ඒ    මියැදෙන්නේ
දුකා විඳින උන් මව් පිය    වැලපෙන්නේ
කකා කේජු දරුවන් අප    තරවෙන්නේ

උඩිං ගොසින් දමනා විට    බෝම්බය
යටිං ඉන්න උන්ටයි ඒ    විනාසය
සැනිං ඇසේ මර හඬ දුක්    විලාපය
කොලොං තොට ද කිලිනොච්චි ද සමානය

කටින් බතල කොල හොඳ හැටි    හිටවීම
සැපෙන් පුටුව මත හිඳ යුද්දෙට    යෑම
තමන් මිස අනුන් හරි යැයි    නොසිතීම
උපන් බිමෙදි මෙන් පුරුදුයි අද    තාම

නිවා ඩුවට ගිය විට ලංකාව    වෙත
දිවා රෑ මදුරු මැසි දුක දැනුණි    කැත
සවා රියක් යන්නට ඇත රිසිය    සිත
අමා රුයි හරිම රිය පැදවීම    මිත

මොකට යමුද ආපසු ලංකාව    බලා
දුකට යලි වැටෙන්නට සිත නැතිය ලොලා
අපට උරුම මේ රට මත්තටම    වෙලා
සැපට කල් ගෙවමු නැත පින නිමා වෙලා

නිකට හිස පැසී තට්ටෙත්    සුදිලෙන්නේ
සිතට දැනුයි සැක සංකා    ඇතිවන්නේ
මොකට බියක් මතු දිනයක    මියැදෙන්නේ
පිණට යලිත් පිට රටකම    ඉපදෙන්නේ

සසර වසන තුරු සිරිලක    ඉපදෙන්න
නිතර එද පැතුවෙමු හද    බැතියෙන්න
මිතුර ඉපිද යලි පිට රටකට    යන්න
එවර වේවි නැවතත් වීසා    ගන්න

දෙඩා හඬා පල කිම ඒ ගැන    ඉතිනේ
කුඩා වේද පත, හිත දහිරිය    ඇතිනේ
වඩා විරිය ඉපදෙමු පිටරටේ    අනේ
වඩා හොඳ හමේ පැහැ සුදු    වූවොතිනේ

තිංකිං මොකද හොඳ නැති යැයි නොරට දෙස
ගොංකිං නොවී අහපල්ලා    මගේ බස
සම්තිං එක සොයා විඳ සැප    රිසි විලස
විංජිං නොකර බැඳගත් ඔය බෙරය ගස!

රසික සූරියආරච්චි
<rasika.suriya@gmail.com>

## ලේඛිකාවගේ සැමියා.....!

ඔබද ගසකි.
ඒ සුවිශාල ගස ලඟම
පැළවුනු....
ඔබද ගසකි.
මලින් සැරසෙන...
රොනින් සපිරෙන..
පලින් බරවෙන
එනමුදු විහඟුන්ද නොදකින
බඹරුන්ද නොඑන...
මිනිසුන්ටද මඟහැරෙන....
උන් සැම රොද බඳින
ඒ සුවිශාල ගස...
ඇය....!
ඔබ වසා පැතිරුන
ඔබ අභිභවාගිය
විශාලම මල් පිපෙන
මිහිරිතම එල දරණ
ඒ සුවිශාල ගස...
ඇය....!
අන් ඉඩමක පැළැවී නම්
ඔබ ද සුවිශාල ගසකි

වර්ණා රසිකා



## අඳුර හා ගිනිසිල

අහස හිස්විය
තරු වැට නිවින
අකීකරු සිහිනයක්
ඇහිපිය අතර බොල් වින
අස්වැසිල්ලක් වී
දිගු කෙරුනු දෑත් වට
යදම් දෑලක් වැටින
පිපෙන්නට මග බැලූ
සුවඳ මල් යායක
බමර හඬ ගොළු වින
කුරුළු ගී සිර වින
තුරු පතක් හදිසියේ
අතු පතර අනාථව
රහසේම ගිලිහින
ගිම්හාන රාත්‍රිය ඇවිලින.

**චන්ද්‍රිකා ද සිල්වා**




## අයියනායක

සෙවණැලි අවදි නොම වන වැව් ඉවුරු කොනේ
කාලය විසින් හෑරුව නුග ගසක    බෙනේ
මළ කා කළුව ගිය ආයුද කැබලි    පෙනේ
දෙවියෙක් නැතද මෙහි බලයක් තිබෙනු    දැනේ

බුද ගුරු සනි හිරුට හිමි හැම    දවස් වල
මේ සංහිඳේ එළියක් ඇත    සවස් කල
ලෙඩ දුක් වලින් මිදුමට බාරයක්    කළ
හැම දෙන එතැන රැස් වෙති ගම    ගෙවල් වල

වන පෙත දැවෙන විට වැද මළ    හිරුගෙ රත
ගනඳුර වසන විට ආලෝකයෙහි    නෙත
සඳ රැස් ගලන විට තෙරපී සෙවණ    මත
එක දෙවියෙක් නොවේ දාහක් එතැන    ඇත

දෙවි දේවතාවුන් සැරිසරන මහ    වනේ
පවතින බලය ඇඟ ලොම් තුඩකටද    දැනේ
මොලයෙන් තමා ලෝකයෙ සුවය    වැනැසුණෝ
මගෙ ගැරහුමට නැත ඒ පිරිස යොමු    වුණෝ

සංහිඳ ළඟ බාරයට කිරි    ඉතිරීම
කෙම්මුර දවස් වල පානින්    සැරසීම
වන අතු කඩා ගස් දෙබලක    දැවටීම
මා නොකෙරුවත් නොකෙළෙම් එය    ගැරහීම

සාගත වසංගත හා එන නියඟ    වලින්
සහනය පතා වන දෙවියන් ළඟට    කෙළින්
යන මේ පිරිස සැරසීමට නුවණ    මලින්
පෙළඹෙන අයට අනුකම්පා කරමි    මුලින්

ගංගොඩ වටා මෝරන වන    ලැහැබ මැන
අහුමුළු නෑර සිය අණසක    පතුරු වන
බලවත් අයියනායක, දෙන    ගොදුරු ගෙන
මේ අය රකිනු මැන යන එන    සියලු තැන

පත්තෑ ගැටුස්සන් දෙබරුන්    සිටින තැන
මීමුන් මදින් මත් වී අං    මදින තැන
වැව් වල මිනී කන කිඹුලන්    ගැනද දැන
මේ අය රකිනු මැන යන එන    සියලු තැන

මාපිල් පිඹුරු නා පොළඟුන්    සිටින තැන
අලි කොටි වලස් මුළු කොළහල    කරන තැන
නිතරම ඔබ පුදන මේ අය    ඇඳින ගෙන
බලවත් දෙවි තුමනි දිව රෑ    රකිනු මැන

විමලරත්න කුමාරගම



## Death

by Harold Pinter

Where was the dead body found?
Who found the dead body?
Was the dead body dead when found?
How was the dead body found?

Who was the dead body?

Who was the father or daughter or brother
Or uncle or sister or mother or son
Of the dead and abandoned body?

Was the body dead when abandoned?
Was the body abandoned?
By whom had it been abandoned?

Was the dead body naked or dressed for a journey?

What made you declare the dead body dead?
Did you declare the dead body dead?
How well did you know the dead body?
How did you know the dead body was dead?

Did you wash the dead body
Did you close both its eyes
Did you bury the body
Did you leave it abandoned
Did you kiss the dead body

Harold Pinter
**(The Nobel Prize in Literature 2005 )**